**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි 03 ක වටිනාකම තක්සේරු නොකර රු. 316,000,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් සඳහා ගෙවිය යුතු වගකීම් ජංගම වගකීම් යටතේ දැක්විය යුතු නමුත් ඉදිරි වර්ෂය වෙනුවෙන් දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු එකතු වටිනාකම රු. 5,660,286 ක ණය වාරික ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වමි. | වගකීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු.2,819,223 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රාග්ධන වැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2019 වර්ෂයට අදාළ රු.241,349 ක වියදම් ණයහිමියන්ට හර නොකර සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක ණයහිමි ශේෂය රු.101,958 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පැවති රු.135,200 ක් වූ ඉන්ධන තොගය ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද රු.108,902 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය මේ වසරේදීද නිරවුල් නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 355,615 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී උපලේඛන සකස් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.12,626,145 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,710,039 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| i. | ලැබිය යුතු රු.3,133,085 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. | ලැබිය යුතු රු.320,400 ක ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 16,200 ක ව්‍යාපාර වසා ඇති බවත්, ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| iii. | ලැබිය යුතු විනෝද බදු රු. 295,940 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු විනෝද බදු අයකර ගැනීම සඳහා අදාළ ආයතනයට නඩු පැවරුවෙමි . | -එම- |
| **(ආ)** | **කුලී**<br>----- | | |
| i. | ලැබිය යුතු කඩ කුලී රු. 2,602,345 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ කුලී ගෙවන මෙන් කඩහිමියන් දැනුවත් කළ බව සහ නොගෙවන්නේ නම් පනත ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | පොළ බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 243,333 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගතය නිසා අයකරගත නොහැකි වූ පොළ බදු ආදායම කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කළ බව සහ හිඟ පවතින බදුකරුවන්ගේ ආරක්ෂිත තැන්පතුව රඳවාගත්තෙමි. | -එම- |
| iii. | ලැබිය යුතු වෙනත් කුලී ආදායම් රු.172,702 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 90,793 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කළ බව සහ ඉතිරි හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු**<br>--------------- | | |
| i. | ලැබිය යුතු රු. 102,250 ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | -එම- |
| ii. | ලැබිය යුතු රු. 101,700 ක දැන්වීම් පුවරු ගාස්තු හා රු. 701,067 ක වෙනත් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව සහ හිඟ වෙනත් බලපත්‍ර ගාස්තු කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කළෙමි. | -එම- |
| **(ඈ)** | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>----------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. 21,366,361 ක් විය. | ඉතිරි හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කර තිබීමෙන් එම ගැසට් පත්‍රයේ V වන උපලේඛනයේ සඳහන් පරිදි අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රායෝජනයට ගැනීම මත එක් දිනකට රු. 50 ක් බැගින් වූ රු.806,090 ක දඩ මුදලක් ගොඩනැගිලි සංවර්ධන සැලසුම් 11 ක අයකර ගෙන නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි ඉදිරියේදී ප්‍රමාද වන ගොඩනැගිලි සංවර්ධන සැලසුම් සඳහා දිනකට රු. 50 බැගින් වූ දඩ මුදලක් අය කිරීමට කටයුතු කරමි. | පනත සහ ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව සතු අංක 02 නිල නිවසේ මාසික ආර්ථික කුලිය 2014 ජනවාරි 01 දිනැති තක්සේරුව අනුව රු.1,800 ක් වුවත් එම තක්සේරුවේ කාලය වසර 06 ක් ඉකුත් වී ඇතත් තක්සේරුව අළුත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිල නිවාසය සඳහා නව තක්සේරුවක් ලබා ගැනීමට ඉල්ලීම් කළෙමි. | නව තක්සේරුවක් මත කුලී අයකළ යුතුය. |
| (ඇ) | පන්නෙගමුව ආලෝක මාවත ආරම්භයේ සිට ජයවර්ධන මහතාගේ නිවස දක්වා වූ මාර්ගයෙහි ඇතිරූ කුට්ටිගල් වල තත්ත්ව පරීක්ෂණය අනුව මාර්ගයේ ඇතිරූ කුට්ටිගල් වලින් සියයට 61 ක් නියමිත ශක්තියෙන් තොර වීම නිසා දරන ලද රු. 1,731,840 ක් වූ වියදම ඵලදායි නොවන ගෙවීමක් විය. | කුට්ටිගල් 18 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් රැගෙන ගොස් තත්ත්ව පරීක්ෂණයක් සිදු කළ බව සහ එම වාර්තාවේ අතුරන ලද කුට්ටිගල් නියමිත ශක්තියෙන් යුක්ත බවට සඳහන් වූයෙන් ගෙවීම් කළෙමි. | ඇස්තමේන්තු කළ ප්‍රමිතියට අදාළ කුට්ටිගල් ඇතිරීමට කටයුතු කළ යුතුය. |